# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1723/20 - 2011 සැප්තැම්බර් 13 වැනි අඟහරුවාදා - 2011.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ම විසින් 2011 මාර්තු මස 17 වැනි දිනැති අංක 1697/25 දරන හා 2011 මැයි 06 දිනැති අංක 1704/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයන් මගින් පළකරන ලද නිවේදන මගින් සංශෝධිත, 2010 නොවැම්බර් මස 22 වැනි දිනැති අංක 1681/3 දරන නිවේදනය 2011 මැයි මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011ක් වූ සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි වරාය හා මහාමාර්ග අමාත්‍ය (අංක 3) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 9 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(2) එම නිවේදනයෙහි රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය (අංක 1) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 25 සිට 26 දක්වා වූ අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් :-

"25. මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ නගර සංවර්ධනය සංරචකය ඇතුලුව කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය හා සම්බන්ධ ක්‍රියාකාරකම්

26. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්

27. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම" ;

09-1258

1A - G 15071— 715 (2011/09)

## නිවැරදි කිරීමයි

## 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත

### 2 වැනි වගන්තිය යටතේ නියෝගය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2011 සැප්තැම්බර් 03 දිනැති අංක 1721/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය යටතේ පළවූ දැන්වීමෙහි

(i) (*අ*) ඡේදයේ අවසානයේ ඇති "හෝ" යන්න "සහ" ලෙස ද,

(ii) (*ආ*) කොටසේ දෙවැනි පේලියේ සඳහන් "මගේ මතය වන අවස්ථාවක" යන්න "මගේ මතය වන බැවින්" ලෙස ද, නිවැරදි විය යුතු ය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011ක් වූ සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

09-1269

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.